# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 1836/9 – 2013 නොවැම්බර් 12 වැනි අඟහරුවාදා – 2013.11.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 311 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/4/2012/ඩී/148.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:
එම්එන්/ඩීබී/ලෑන්ඩ්/ඩී2එල්ඒකිව්/03.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ඔක්තෝබර් මස 25 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, මන්නාරම.

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උයිර්තරාසංකුලම් එම්එන්/95 කෝරළේ සුළු කොට්ඨාසයේ, ඉලුප්පන්කුලම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක එම්ඒ/එම්එන්එන්/2013/118 හා 2013.09.13 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ, බී වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 1.7892ක් පමණ වූ පරන්කිකාමම් නැමති පහත සඳහන් ඉඩම් කැබලි දෙක (02)ට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – පරන්කිකාමම් – ප්‍රමාණය: හෙක්. 0.8692**
උතුරට: ඇළ; නැගෙනහිරට: පාර (ප්‍රාදේශීය සභා); දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: කැබලි අක්ෂර බී සහ ජෝසප් වෝල්ටර් මාර්ටින් රත්නරාජා හිමිකම් කියන කුඹුර.

02. **කැබලි අක්ෂර 'බී' – පරන්කිකාමම් – ප්‍රමාණය: හෙක්. 0.9200**
උතුරට: කැබලි අක්ෂර ඒ සහ ජෝසප් වෝල්ටර් මාර්ටින් රත්නරාජා හිමිකම් කියන කුඹුර; නැගෙනහිරට: පාර (ප්‍රාදේශීය සභා); දකුණට: පාර (ප්‍රාදේශීය සභා) සහ වාරිමාර්ග ඇළ; බටහිරට: ජෝසප් වෝල්ටර් මාර්ටින් රත්නරාජා හිමිකම් කියන කුඹුර.

11 - 911


1A – G 18520 – 180 (2013/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*